# සංස්කෘත අලංකාරවාදයේ බලපෑමට යටත් වූ සිංහල පද්‍යය.

දීගල්ලේ සිරිසුභාරති පිරිවෙන්හි ත්‍රිපිටකවේදී ගරු කබලෑවේ සිරි සුමන ස්ථවිරයන් වහන්සේ විසිනි.

සිංහල භාෂා සාහිත්‍යය දෙස විමර්ශනාත්මක වැ බැලීමේ දී පැහැදිලි වැ පෙනී යන්නේ එය විවිධ භාෂාශ්‍රයයෙන් ගොඩ නැගී සංවර්ධනයට පත් වූ බව යි. ප්‍රථම යෙන් ම පාළියේත් දෙවැනි වැ සංස්කෘතයේත් ඉන්පසු දෙමළ, පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි ආදී පෙරඅපර දෙදිග භාෂාවන්ගේත් ආභාසය ලැබීම හේතු කොට ගෙන සිංහල භාෂා සාහිත්‍යයේ සිදු වූ වෙනස්කම් රාශියක් දක්නට ලැබේ. සිංහලයේ මුහුණුවර හා සංවර්ධනය වර්තමාන ස්වරූපයෙන් පැවැතීමට ඒ විවිධ භාෂාවල ආභාසය උපයෝගි වී ඇත. අනුරාධපුර යුගයේ මුල් අවධියේ සිංහලය පාළි භාෂාවේ සෙවනෙහි හැඩගැසුණු අතර එහි අගභාගය වනවිට සංස්කෘතයේ බලපෑමට ද යටත්විණි. පොළොන්නරු යුගයේ එහි අග්‍රප්‍රාප්තිය සිංහලයේ හැම පැත්තකින් ම දක්නට ලැබෙන අතර මෙකල පහළ වූ පද්‍ය ග්‍රන්ථයන් ද අලංකාරවත් වූ බව පෙනී යයි. පොළොන්නරු යුගයේ කරුණු කීපයකින් ම සංස්කෘතය වැඩී ගිය බව පෙනේ.

1. මහායාන ධර්ම ආක්‍රමණය,
2 බ්‍රාහ්මණයන් ලක්දිව විසීම,
3. සිංහල කාව්‍ය රචනයට සංස්කෘත කාව්‍යානුශාසනා අවශ්‍ය වීම,
4. ලක්දිව වැසියන් විසින් සංස්කෘත වෛද්‍ය ග්‍රන්ථයන් හැදෑරීම,
5. සංස්කෘත ව්‍යාකරණවිධි අනුගමනය,
6. රාජ්‍ය පාලනයට සංස්කෘත නීති ශාස්ත්‍රය අවශ්‍ය වීම,

යන මේ කරුණු වලිනි.

පොළොන්නරුයුගයේ ජනසිත් කෘත්‍රිම කඨෝර දේ වෙත ඇදී ගිය අතර සංස්කෘතය ද එහි සාටෝප්පවත්භාවය නිසා කාලයට ගැළපී ගියේය. ලක්දිව සංස්කෘතය පැතිරයාම තරම්ම වූ ඉතිහාසයක් සිංහල කාව්‍යාරම්භයට ද ඇත. ඒ නිසා එහි ග්‍රහණයට හසු වීම අනිවාර්‍ය සිද්ධියකි. සංස්කෘතයට පෙර පාළි භාෂාව ලක්දිව ප්‍රචලිත වුවද සිංහලය ආගමික සාහිත්‍යයක් වූ පාළියට වඩා සංස්කෘතයේ ආභාසය ලැබුයේ එය ලෞකික සාහිත්‍යාංගයක් වූ කාව්‍ය නාටකාදියෙන් පරිපූර්ණ වූ හෙයිනි.

සංස්කෘත විචාරකලාව සිද්ධාන්තසයකින් සමන්විත වේ. එහි රස, ධ්වනි ඖචිත්‍යය වැනි විශිෂ්ට කාව්‍යසම්ප්‍රදායයන් භාරතයේ වඩාත් ප්‍රචලිත වන්නට වූ අතර ලක්දිව කවියන් වඩාත් අනුගමනය කර ඇත්තේ සංස්කෘත අලංකාර සම්ප්‍රදායය ගුරු කොට සකස් කරගත් කාව්‍ය මාර්ගයක් බව පැරණි ග්‍රන්ථ විමර්ශනයෙන් හෙළි වන්නකි. තරමක් අඩු වුවත් සිංහල කවීන් රසවාදය පිළිබඳ දැනුම ද තම කෘතිවලින් හෙළිකර ඇත.[1] උත්තම කාව්‍යකරණයට අවශ්‍ය උපදෙස් ලබා තිබියදීත් සිංහල කවීන් අලංකාර සම්ප්‍රදාය ම ගුරුකොට ගත්තේ හින්දු සංස්කෘතිය විසින් මෙරට රාජ්‍යත්වය කෙරෙහි ආරෝපණය කරන ලද දේවත්වය හමුවේ දණ නැමීම නිසාය යනු විචාරක මතය යි. රජවරුන් මෙන් ම වෙනත් බලවත් පුද්ගලයන් වර්ණනා කිරීම මැ

පරමාර්ථය කොට ගත් සිංහල කවීන්ට එහි ලා අලංකාර සම්ප්‍රදායය අතිශයින් උපකාරි වීම පුදුමයෙක් නොවේ. උසස් කාව්‍ය සම්ප්‍රදායයන් දැක දැනත් ඉන් සහාය නො ලබා අලංකාර සම්ප්‍රදායට මැ සිංහල කවීන් නතුවීම නිසා සිංහල කාව්‍යග්‍රන්ථයන් තුළට වර්ණනාධික බව හා සමරූපතාවවැනි පාඨක මනස උදාසීන කරවන ලක්ෂණ ඇතුළු වූ බව ඇතැමුන්ගේ අදහස යි.

සංස්කෘත සාහිත්‍යය විමර්ශනය කිරීමෙහි ලා විචාර කලාවක් වූ අලංකාර වාදය කාව්‍යය හසුරුවන බලවේගය බවට පත් විය. මේ නිසා සංස්කෘත කවීන් එම සම්ප්‍රදායයට අනුකූල වැ තම කෘතීන් රචනා කළ අතර සංස්කෘතයේ ආභාසයෙන් අලංකාරරීතිය සිංහල කාව්‍යසාහිත්‍යය හසුරුවන විනය ක්‍රමයක් බවට පත් විය. සිංහල කාව්‍ය විවේචනය සඳහා ප්‍රචලිත විචාර ග්‍රන්ථ ලෙස සැලකෙනුයේ සියබස්ලකර හා සිදත් සඟරාවේ අවසන් පරිච්ඡේදයත් ය. සියබස්ලකර දණ්ඩින්ගේ කාව්‍යාදර්ශයේ පරිවර්තනයක් වන අතර එය රචිත කාලය වන විට සිංහල පද්‍ය කරණය උසස් තත්ත්වයක පැවතුණ ද සිංහල කවියා ඉන්දීය විචාරකයින්ගේ මත පිළිගැනීමට සූදානම්ව සිටි බව පෙනේ.[2] සිංහල කාව්‍ය විචාර මාර්ගය නිශ්චය කිරීමත්, කාව්‍ය සම්ප්‍රදාය හැඩගැස්වීමත් පිළිබඳ වැ කැපවුණු එක මැ ග්‍රන්ථය සියබස්ලකර වන අතර එය සිංහල විචාර මාර්ගය පිළිබඳ පූර්ණ අවබෝධයක් ද ලබා දෙයි. සිදත් සඟරාවේ අලංකාර පරිච්ඡේදය කාව්‍යයක අගය මැනීමෙහි දී සිංහල විචාරයන් සහ කවීන් දරූ අදහස් පිළිබඳ වැ යම් ආලෝකයක් ලබා දෙයි. සංස්කෘත අලංකාර වාදයෙන් පිටතට නො ගිය මේ කෘති දෙක ම කාව්‍යයක අගය මැණිය යුත්තේ අලංකාරවාදය මිම්ම කරගෙන බව ඉදිරිපත් කරමින් සිංහල සාහිත්‍යය කෙරෙහි අලංකාරවාදයේ බලපෑම තහවුරු කළේය.

අනුරාධපුර යුගයේ මුල් භාගයේ ලියැවී ඇති සීගිරි ගී සිංහල සාහිත්‍යයේ මුල්ම ගී ලෙස යැ සැලකෙනුයේ. සීගිරි ගී සමය වන විට කාව්‍යයේ සාරය රසය යන මතය පිළිගැනී තිබුණු නිසා පශ්චාත් කාලීන සිංහල ග්‍රන්ථවලත් සංස්කෘත සාහිත්‍යයේත් එන අලංකාරාදිය සීගිරි පද්‍යවල දක්නා ලැබෙනුයේ විරල වශයෙනි. එනමුදු අලංකාර පිළිබඳ අදහස් සීගිරි කවීන් දැන සිටි බවට සාධක එම ගී අතරින් ලැබිය හැකි ය. සියබස්ලකරට පෙර කාව්‍යකරණයට අනුශාසනයන් පැවැති බව එම ග්‍රන්ථයෙන්ම පෙනේ.[3] සංස්කෘත අලංකාරවාදීන් උපයෝගී කර නො ගත් උභය භාෂා අලංකාරය (දෙබසක් මගින් කවියාගේ අදහස කියා පෑම) සීගිරි කවීන් දැඩිසේ උපයෝගී කර ගැනීමෙන් එම අදහස ස්ඵුට වේ. සංස්කෘත අලංකාර වාදීන් නිතර විස්තර කරන ලද උපමා, රූපක, උත්ප්‍රේක්ෂා, අර්ථාන්තරන්‍යාස, අතිශයෝක්ති මෙවැනි අලංකාරවලට නැඹුරු වූ ගී රාශියක් සීගිරි පද්‍යවලදක්නා ලැබෙන අතර සීගිරි කවියාට කවි සිතුවිලි ප්‍රකාශ කිරීමේ ප්‍රබල මාධ්‍යයක් වශයෙන් අලංකාරවලින් ලබාගත හැකි ප්‍රයෝජනය පිළිබඳව අවබෝධයක් සීගිරි කවියාට තිබුණු බව පෙන්නුම් කරයි. ශබ්දාලංකාර පිණිස වෙහෙස ගත් තැන් දුර්ලභ වුවද ත - න වැනි අක්ෂර එක ළඟ යොදා අනුප්‍රාසය ඉපදවීමට යත්න දරා ඇති තැන් අතරින් පතර දක්නා ලැබේ.

පොළොන්නරු - දඹදෙණි යුගවල ලියැවුණු ග්‍රන්ථ කීපයෙකින් සමන්විත ගී කාව්‍ය යුගයට මුවදෙව්දාව, සසදාව, කව් සිළුමිණ යන ග්‍රන්ථ අයත් වේ. සංස්කෘත සාහිත්‍ය විචාරකයින් අනුමත කළ රචනා සම්ප්‍රදායට අනුකූල වන පරිද්දෙන් සියබස් ලකරේ එන උපදේශයන් ළඟින්ම ඇසුරු කරමින් ලියා ඇති මේ ගී පොත් සංස්කෘත අලංකාරවාදයේ හා කවි සමයේ බලපෑමට ගොදුරුව ඇත. රඝුවංශ, කුමාර සම්භව,

ශිශුපාල වධ, කිරාතාර්ජුනීය ආදී සංස්කෘත අලංකාර ග්‍රන්ථවල ආභාසය ද ගී කව්වලට ලැබී ඇති අතර අලංකාර වාදයේ දැඩි බල පෑම නිසා එම ග්‍රන්ථයන් කෘත්‍රිම ස්වරූපයක් ගෙන ඇති බව විචාරකයෝ පවසති. "අලංකාරො කටක - කුණ්ඩලවත්" යනාදී ඉගැන්වීම් කළ ආලංකාරිකයෝ පද්‍යයට ශෝභාව දෙන උපමා රූපකාදී අලංකාර කාව්‍යයට අත්‍යවශ්‍ය වූවක් ලෙස සැළකූහ.

ඉන්දියාවේ අලංකාර වාදය දියුණු වූයේ කාලිදාසගෙන් පසුව ය. එයට නැඹුරුවීමත් සමග මැ සාහිත්‍ය කලාව ද පිරිහී ගියාය. ව්‍යාජ කාව්‍ය බහුල විය. ලක්දිව සාහිත්‍ය ග්‍රන්ථ බිහි වූයේ ඉන්දියාවේ සාහිත්‍යය පිරිහී ගිය මේ සමයේ ය. සාහිත්‍යයේ අඳුරු යුගය වූ දොළොස් වන සියවසේ සිට සොළොස් වන සියවස දක්වා කරන ලද සිංහල පද්‍ය රචනයන් ගතානුගතික අනුකරණ කාව්‍යයන් බවට පත් විය.[4]

මේ කාව්‍යයන් පිළිබඳ වැ විමැසුම් කළ විචාරකයන්ගෙන් බොහෝ දෙනෙක් එම කවියන් තම පාණ්ඩිත්‍යය ප්‍රකට කරනු සඳහා මහා කාව්‍ය ලක්ෂණ ඇතුළත් කිරීමට ගොස් කාව්‍යයන්හි හරය යටපත් කොට ඇති බවට දෙස් නගති. නගර, රජ, සරා, නිසා, උද මගවැණුම් ආදිය යෙදීමෙන් ජාතක කථාව පැවසීම පසෙක තබා අලංකාර දැනුම පැවසීම සඳහා අලංකාර නීති අනුගමනය කර ඇති බව ද පවසති. හුදෙක් ජාතක කථාව වර්ණනාවක් සම්බන්ධ කිරීමේ හුයලෙස යොද ගත් ගී කවියන් තම කෘති අලංකාරයනට උදහරණ සැපයීම සඳහාම රචනා කරන ලදැයි චෝදනා කරති. අර්ථාලංකාර හා ශබ්දාලංකාරයන්ගෙන් පොෂිත ගී කාව්‍යයන් කාව්‍යානුකරණයන් බවත් අලංකාර ශාස්ත්‍රයට යට වැ කතා පුවතට අනුචිත ශෘංගාරාත්මක වැණුම් රසෙකින් ශාන්ත රසය මවා පෑමට ගත් උත්සාහයක් ලෙස හැඳින්විය හැකි බව ද කෙනෙක් පැවසූහ. ශාන්ත පරිසරයක් මැවිය යුතු තැන ඊට හාත්පසින් ම වෙනස් කාමුක පරිසරයක් මවා පා ඇති ගී කවියන් බෞද්ධ කථා වස්තුවකට වර්ණනා ඇතුළත් කිරීමේ දී උචිත-අනුචිත බව වටහා ගැනීමේ අන්ධයන් බවට පත් වී ඇතැයි දෙෂ දර්ශන යට ලක් කරති.

කව් සිළුමිණේ දී අතිශයෝක්තියට බර වූ කුසාපුර වැණුමෙන් ගතානුගතික අනුකරණයක් මිස කතුවරයාගේ ප්‍රතිභා ශක්තියක් පිළිබිඹු නොකරන අතර පබාවතී වැණුමෙන් කෙලෙස් තැවූ තාපසයකුගේ වුව මනස කළඹාලිය හැකි ස්ත්‍රී වර්ණනයක් කරයි. මෙවැනි වැණුම් සංස්කෘත මහා කාව්‍යවලින් උපුටා ගත් අතර එසේ වූයේ සිංහල කවි සමය ද සංස්කෘත අලංකාර වාදය මගින් හික්මවන ලද නිසයි. නියම ප්‍රේම කථාවක් සේ පෙනෙන කව් සිළුමිණ ආගමික මුහුණුවරකට වඩා ලෞකික මුහුණු වරක් ගෙන ඇත.[5]

සිංහල සාහිත්‍යයේ ප්‍රසිද්ධ මහා කාව්‍ය ග්‍රන්ථ ගණයෙහි ලා සැළකෙන කාව්‍යශේඛරය වැනි ග්‍රන්ථ ද සංස්කෘත කාව්‍ය මාර්ගයට නැඹුරු වැ ඇති අතර ඒවායේ උගන්වන කවි සමය ද අලංකාර වලින් පරිපොෂිත ය. කාව්‍යයේ මුඛ්‍ය අදහසට එතරම් නොගැළපෙන කථාවලින් ප්‍රධාන කථාව සැරසීමට ගත් උත්සාහයත් වර්ණනා ඇතුළත් කිරීමට හැකි වන සේ කථාව දීර්ඝස්සා ගැනීමත් අලංකාරවාදයට නැඹුරු වීමේ ප්‍රතිඵල ලෙස දක්වන විචාරකයෝ ඒවායෙහි යම් විසිතුරු කියුමක් වේ ද, ඒ හා සමාන කියුමක් සංස්කෘත සාහිත්‍ය ග්‍රන්ථයකින් දක්නට ලැබෙන නිසා මහා කාව්‍ය ග්‍රන්ථ සැපයූ කතුවරුන් ද සංස්කෘත ග්‍රන්ථ අනුකරණය කර ඇති බවත් ඒ තුළින් ඔවුන්ගේ ප්‍රතිභා ශක්තියේ හීන භාවය ද කැපී පෙනෙන බවත් දක්වති.

මීළඟට හමුවන සන්දේශ පොත් සංස්කෘත අලංකාරවාදයේ බලපෑමෙන් එක්තරා ප්‍රමාණයකට මිදී සිංහල කවීන්ගේ

ස්වෛරී චින්තනය පිළිබිඹු කරන කාව්‍ය විශේෂයෙකි. මේ ග්‍රන්ථවල වස්තු වූ විෂයයන් නිසා ස්වෛරීලක්ෂණ විදහාපෑව ද යම් යම් වර්ණනා කිරීමේදී අලංකාර වාදයට නැඹුරු වැ ඇති බව පෙනේ. ඒ අයුරින් සකුලකර වැණුම් මග සිංහල සන්දේශ කවීන් භක්තියෙන් සලකන ලද්දේ ඔවුන් අතිශයෝක්ති වර්ණනයට ආසා කළ නිසා යැයි විචාරකයෝ පවසති.

දූත කාව්‍ය සංකල්පය ද පටන් ගැනෙනු යේ සංස්කෘතයෙනි. සංස්කෘත කාව්‍ය ශාස්ත්‍ර යෙහි දූත කාව්‍යයෙක තිබිය යුතු ලක්ෂණ සවිස්තර වැ දක්වා ඇත. සිංහල කවීන් ද ඒ ඇසුරින් සකස් කර ගත් සම්මත රාමුව උල්ලංඝනය කිරීමට උත්සාහ දරා නැත. සන්දේශ පොත්වල වුව ද බාහිර ආකෘතිය නියම කරන ලද්දේ සංස්කෘත පොත් මගිනි.[6]

වෙනත් කෘතිවලට වඩා කාව්‍යමය වූ සිතුම් පැතුම් වලින් සමන්විත ගුත්තිලය පාඨකයන් කුල්මත් කරවන කාව්‍යයක් වුව ද එය ද තරමක් දුරට සම්ප්‍රදායානුකූල වැණුම් ක්‍රමවලට අවනත වූ අතර සංස්කෘත අලංකාරවලින් ඉදිරිපත් කළ කාව්‍ය ආකෘතිය වෙනස් නො වී පවතින බව උගතුන්ගේ පිළිගැනීම යි.

කෝට්ටේයුගයෙන් පසු සිංහල සාහිත්‍යය පිරිහීමේ ප්‍රපාතය කරා ඇදී ගිය අතර දෙමළ ආදී භාෂාවල ආභාසය නිසා මුල් කවීන්ගේ කෘතිවල දක්නා ලැබෙන පණ්ඩිත කාව්‍ය ලක්ෂණ ඒවායින් ගිලිහී ගොස් ඇත. අලංකාර වාදයේ බලපෑම ඌන වී ගිය ද එයින් ඉදිරිපත් කළ කාව්‍ය ආකෘතිය සහ වර්ණනා ක්‍රමය සිංහල පැරණි පොත් ඇසුරෙන් තවදුරටත් නො සිඳී ගලා ගියේ ය.

නූතන යුගයේ සංස්කෘත හදාරන්නන් දුර්ලභ වීම නිසා සංස්කෘතය කෙළින්ම සිංහල සාහිත්‍යය හැඩ ගැස්වීමෙහි නො යෙදේ. එහෙත් සංස්කෘත කවීන් අනුගමනය කරන නූතන සිංහල කවීහු පැරණි සිංහල කවි ඇසුරෙන් සංස්කෘත අදහස් හා අලංකාරයන් යොදති.

ඇතැම් විචාරකයන්ගේ මත අනුව සිංහල කවිය සංස්කෘතය නිසා වෙනස් නො වූයේ නම් හෙළ බසේ දිස්වනුයේ සීගිරි පද්‍ය අනුව ගිය ජන කවි සම්ප්‍රදායයෙකි. මේ කාව්‍ය සම්ප්‍රදය ඇතැම් විට සංස්කෘත කාව්‍යයට වඩා උසස් තත්ත්වයක් ගැනීමට ඉඩ තිබුණි. එමගින් සිංහලයට ස්වාධීන වූ වැදගත් කාව්‍ය සාහිත්‍යයක් පහළවීමට ද ඉඩ තිබුණි. පැරණි සිංහල කාව්‍යයන් අතර ලෝක සාහිත්‍යයේ සුප්‍රසිද්ධ කාව්‍යයන් හා සමාන කළ හැකි හෝ ලෝක සාහිත්‍යයෙහි උසස් ස්ථානයක් ගන්නා කාව්‍යයක් සොයා ගැනීමට අපහසු වන්නේ සිංහල කවියන් සංස්කෘතයට වහල් වූ හෙයිනි.

මෙවැනි අදහස් නවීන විචාරකයින් පහළ කරන්නේ ස්වාධීන විචාරයෙහි පිහිටා නොවන බව අපගේ හැඟීම යි. ගතානුගතික විචාර බුද්ධියෙන් පොෂණය වූ නූතන අපේ විචාරකයනට සංස්කෘතයෙන් පාළියෙන් ගත් දය පමණක් සිංහලයෙහි පැනෙන්නේ සිංහලය ප්‍රභව වූ සැටිත් ව්‍යාප්තියට පැමිණි සැටිත් පොෂණය වූ සැටිත් ඔවුනට අවිෂය බැවිනැයි හැඟේ. නවීන ඇතැම් විචාරක කෙනෙක් සිංහලයේ සංස්කෘත අලංකාර බලපෑම දුටු පමණින් එය ගැරහීමට උත්සුක වෙති. එහෙත් සිංහල සාහිත්‍යය පමණක් නොව එහි සෑම අංගයක්ම වාගේ සංස්කෘතය හා වෙනත් විවිධ භාෂාවන්ගේ ආභාසය ලැබීමෙන් පොෂණය වැ තිබීම අරුමයෙක් නොවේ. එය කවුරුන් විසිනුත් පිළිගන්නා සත්‍යයෙකි. එපමණකින් සිංහලය ගැරහුමට හෝ නින්දවට සුදුසු නොවේ. භාෂාවක් සැබෑ නම් එය පැරණි වූත්, සමකාලින වූත් භාෂාවන්ගේ ආභාසය ලැබීමත් යම් යම් ජනප්‍රිය භාෂා ලක්ෂණ

තමන් කරා ඇද ගැනීමත් ස්වභාවය කොට ඇති බැවිනි. එම භාෂා ධර්මතාවට සිංහලය ද ගොදුරු විය. සිංහලය මතු නොව පාලි ආදී වෙනත් භාෂාවන් ද සංස්කෘත ප්‍රධාන කොට ඇති විවිධ භාෂා ආශ්‍රයයෙන් පොෂණය වැ වැඩී ගිය බව ප්‍රකටය එහෙත් එය පහත් කොට සලකන්නෙක් එයට නිග්‍රහ කරන්නෙක් නැති. එසේ නම් සිංහලය හෝ පැරැණි සිංහල ගත්කරුවන් හෝ ගැරහුම් ලැබිය යුත්තෝ නොවෙති. හුදෙක් ස්වාධීනව නැගී සිටීමට දරන ප්‍රයත්නයක දී සංස්කෘත භාෂාවේ ජනප්‍රිය අංගයක් වූ අලංකාර වාදය වැනි අංගයන්ගේ උපකාරයක් ලැබීම පමණකි සිදුවී ඇත්තේ. තවද අලංකාර වාදයෙන් භාෂාවක ව්‍යාප්තියට කිසිදු හානියෙක් නැත. ස්වභාවෝක්තියම කීවත් එය ද අලංකාර වාදයටම අයත් ය. ඉපැරණි සමාජයෙහි පටන් සිංහලය විවිධ අංගයන්ගෙන් පොෂණය කරනු සඳහා අප්‍රතිහත ධෛර්‍ය්‍යයෙන් ක්‍රියා කළ සාහිත්‍යධරයන් හා ඔවුන්ගේ කෘතීන් යමෙක් ගරහා නම් ඒ අඥාන කමෙකැයි කිව යුතුය.

1. කව් සිළුමිණ 2, 584 ගී.
2. සිංහලය හා සංස්කෘතය 51 පිට.
3. සියබස්ලකර 3 වන ගීය.
4. සිංහල සාහිත්‍යයේ නැගීම 36 පිට.
5. සිංහල සාහිත්‍ය ලතා 20 පිට.
6. විමංසා 1969 — 18 කලාපය 19 පිට,